# සිංහල භාෂාව ලේඛනගත කිරීමේ දී ඇති වන සංකීර්ණතා මගහරවා ගැනීමට අජිත් තිලකසේන විසින් යෝජිත ප්‍රායෝගික සිංහල හෝඩිය පිළිබඳ අධ්‍යයනයක්

*ඩබ්ලිව්.එම්.එන්.ඩී. අබේරුවන්*[1] *එම්.ජී.කේ.එල්. බණ්ඩාර*[2]

සිංහල භාෂාව සංකීර්ණ වූ භාෂාවකි. මෙම සංකීර්ණත්වය කථනයේ දී ඇති වූවක් නොවන අතර ලේඛන කටයුතු සිදු කිරීමේ දී ඇති වූවකි. පිළිගත් සම්මත අක්ෂර මාලාවේ දීර්ඝ ස්වර දැක්වීමේ දී යොදන සංකේතවල විවිධත්වය, ණ-න, ල-ළ, ශ-ෂ-ස අක්ෂර භේදය, අල්ප්‍රාණ මහප්‍රාණ භේදය දැක්වීමේ දී ඇති වන දොෂ පදනම් කොට ගත් ගැටලුවකි. පුද්ගල භාෂාන්තර ඥානය වර්ධනය කර ගැනීම උදෙසා අදාළ භාෂාවේ අක්ෂර රූපාවලිය දැන සිටීම ඉතා වැදගත් වේ. භාෂාවක සරල හා නිරවුල් අක්ෂර මාලාවක් පවති නම් එම භාෂාව ලේඛන ගත කිරීමේ දී හට ගන්නා වූ ව්‍යාකූලතා අවම වේ. සිංහල භාෂාව මුඛ්‍ය භාෂාව කර ගත් ලාංකිකයන් මෙන් ම භාෂාන්තර ඥාන වර්ධනයට උත්සුක වන දේශදේශාන්තර ජනයාහට සරල නිරවුල් අක්ෂර මාලාවක අවශ්‍යතාව නිරන්තරයෙන් පවතී. කථනයේ දී ශබ්ද වසයෙන් නිකුත් කෙරෙන වචන ලේඛනයේ දී විවිධ සංකේත මඟින් නිරූපණය වේ. එක ම ශබ්දයක් සඳහා වන විවිධ සංකේත ලේඛනය තුළ ගැටලු සහගත බැවින් ඒ සඳහා පිළියම් සොයන්නන් අතර වූ අජිත් තිලකසේන ස්වාධීන ව මෙතෙක් පැවති සම්මතය පසෙක ලා නව්‍ය ක්‍රමයක් ගොඩනගා ගත් ලේඛකයෙකි. ඔහු විසින් සිංහලයට හඳුන්වා දෙනු ලැබූ අක්ෂර මාලාව 'ප්‍රායෝගික සිංහල හෝඩිය' නම් විය. සිංහල භාෂාව ලේඛනගත කිරීමේ දී ඇති වන සංකීර්ණතා මඟහරවා ගැනීම උදෙසා ප්‍රායෝගික සිංහල හෝඩිය සුදුසු ද යන්න මෙම පර්යේෂණයේ ගැටලුව වන අතර සිංහල අක්ෂර මාලාවේ පවතින ගැටලු හඳුනා ගැනීම, අජිත් තිලකසේනගේ ප්‍රායෝගික සිංහල හෝඩිය පිළිබඳ අවබෝධ කර ගැනීම මෙහි අරමුණු වේ. සිංහල භාෂක සමාජයට මෙන් ම සිංහල භාෂා ශක්‍යතාව වර්ධනයට උත්සුක අන්‍ය භාෂක සමාජයන්ට ද මෙය වැදගත් වේ. විද්වත් දේශන, පුවත්පත් ලිපි, භාෂාත්මක ලිපි, විද්වත් ග්‍රන්ථාදි මූලාශ්‍රය පරිශීලනය කොට ගුණාත්මක පර්යේෂණ ක්‍රමවේදය යටතේ තොරතුරු සම්පාදනය කොට ගත් අතර සිංහල ලේඛනය සඳහා යෝජනාවක් පමණක් වූ ප්‍රායෝගික අක්ෂර මාලාව පිළිබඳ භාෂක සමාජය දැනුවත් කිරීම මෙහි අවසන් ප්‍රතිඵලය වේ. සිංහල භාෂාව වසර ගණනාවක් පුරා වෙනස්කම් රාශියකට භාජනය වෙමින් වත්මන් තත්ත්වය දක්වා පරිණාමය වී ඇත. භාෂාවක් නිරන්තරයෙන් වෙනස්වීම්වලට භාජනය විය යුතු බවත්, වර්තමානය හා සසඳන කල සිංහල අක්ෂර මාලාව නිරවුල් වීම මඟින් ජාත්‍යන්තර වසයෙන් සාර්ථක ගනුදෙනුවක නිරත විය හැකි බවත් මෙමඟින් එළඹිය හැකි නිගමන වේ.

***ප්‍රමුඛ පද:*** සිංහල භාෂාව, භාෂා පරිණාමය, ප්‍රායෝගික සිංහල හෝඩිය, භාෂණය, ලේඛනය

[1] ශ්‍රී ලංකා රජරට විශ්වවිද්‍යාලය, මිහින්තලේ, niroshanidilrukshi1998@gmail.com

[2] ශ්‍රී ලංකා රජරට විශ්වවිද්‍යාලය, මිහින්තලේ, kavindu.0098@gmail.com